**2025-04-28 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල
රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. උසස් අධ්‍යාපන සහයෝගිතාවන් උදෙසා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය හා සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම**

ශ්‍රී ලාංකීය උපාධිධාරි සිසුන් සඳහා පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව අවස්ථා ලබා ගැනීම ඇතුළු උසස් අධ්‍යාපනික සහයෝගිතාවන් ඇති කර ගැනීම උදෙසා, ගෝලීය විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අතර ප්‍රමුඛ ස්ථානයක පසුවන සිංගප්පූරු ජනරජයේ සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමට යෝජනා කර තිබේ. යෝජිත අවබෝධතා ගිවිසුමට එළඹීම මඟින් ශ්‍රී ලාංකීය සිසුන්ට සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි ඇතුළුව පශ්චාත් උපාධි හැදෑරීමටත්, ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගි වීමටත්, ඒකාබද්ධ පර්යේෂණ සිදු කිරීමටත් අවස්ථාව හිමි වනු ඇත. එකී අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

**02. ආර්ථික සංගණනය - 2025/26**

2013/14 වර්ෂයන්හිදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් අවසන් වරට ආර්ථික සංගණනය පවත්වා තිබේ. එම සංගණනයේදී රැස් කරන ලද දත්ත යාවත්කාලීන කිරීම සඳහා කෘෂිකාර්මික සහ කෘෂිකාර්මික නොවන ආර්ථික ක්‍රියාකාරකම් වෙන වෙනම අදියර දෙකකින් ආවරණය වන පරිදි, 2025 සහ 2026 යන වර්ෂයන්හි දී ආර්ථික සංගණනය පැවැත්වීමට දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත. ඒ අනුව, 2025 වර්ෂයේදී කෘෂිකාර්මික කටයුතු සහ 2026 වර්ෂයේදී කෘෂිකාර්මික නොවන කටයුතු ගණන් ගැනීම ආවරණය වන පරිදි ආර්ථික සංගණනය 2025 සහ 2026 යන වර්ෂවලදී පැවැත්වීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.

දු තො T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk

www.dgi.gov.lk
www.news.lk

**03. කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (KOICA) ආධාර යටතේ කොළඹ මහ නගර සභාව සඳහා පූර්ණ ස්වයංක්‍රීය ආදායම් උත්පාදන පද්ධතියක් ස්ථාපිත කිරීම**

වරිපනම් බදු, බලපත්‍ර ගාස්තු, වෙළෙඳ බදු සහ මුද්දර ගාස්තු යන ප්‍රධාන ආදායම් ප්‍රභව 04 මඟින් කොළඹ මහ නගර සභාව ඉහළ ආදායමක් උත්පාදනය කරනු ලබයි. එම ආදායම් ප්‍රභව 04 ස්වයංක්‍රීයකරණය කිරීමෙන් සමස්ත ආදායම් උත්පාදනය ඉහළ නංවා ගැනීම සඳහා කොළඹ මහ නගර සභාව, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව එක්ව කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය වෙත සංකල්ප පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ඒ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 8.5ක ආධාර මුදලක් ලබා දීමට කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟතාව පළ කර තිබේ. එකී එකඟතාව පිළිබඳව සම්මුතිය සඳහා නීතිපතිගේ නිෂ්කාශනය සහ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබා ගෙන ඇත. ඒ අනුව, කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් ලබා දෙන ආධාර උපයෝගී කර ගනිමින් කොළඹ මහ නගර සභාවේ ආදායම් ප්‍රභව ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන එකඟතාව පිළිබඳව සම්මුතියට එළඹීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. ශ්‍රී බුද්ධ වර්ෂ 2569 වන රාජ්‍ය වෙසක් මහෝත්සවය**

අතිපූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේලාගේ සහ සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ අනුශාසනා පරිදි ශ්‍රී බුද්ධ වර්ෂ 2569 (2025) රාජ්‍ය වෙසක් උත්සවය බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව එක්ව නුවරඑළිය දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් නුවරඑළිය ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන විහාරස්ථානයේ දී පැවැත්වීම සුදුසු බවට හඳුනාගනු ලැබ ඇත. මෙම වර්ෂයේ රාජ්‍ය වෙසක් මහෝත්සවය "භජෙථ මිත්තෙ කල්‍යාණෙ - භජෙථ පුරිසුත්තමෙ" (කලණ ගුණ ඇති උතුම් මිතුරන් ඇසුරු කරමු) යන තේමාව යටතේ පැවැත්වීමට තීරණය කර තිබේ. ඒ අනුව, නුවරඑළිය ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් ජාතික වෙසක් මහෝත්සවය පැවැත්වීමටත්, 2025 වර්ෂයේ මැයි මස 10 දින සිට 16 දින දක්වා වෙසක් සතිය ලෙස ප්‍රකාශයට පත් කිරීමටත්, එම කාලසීමාව තුළ විවිධ බෞද්ධාගමික වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීමටත් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි විෂය පථයන් යටතට ගැනෙන පනත් සංශෝධනය කිරීම**

ශ්‍රී ලංකාවේ ආර්ථික පරිවර්තනය වේගවත් කිරීම සඳහා ශක්තිමත් සහ සුදුසු ආයතනික සැකැස්මක් නිර්මාණය කිරීම පිණිස කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි විෂය පථයන් යටතට ගැනෙන ඇතැම් පනත් මෙම වර්ෂය තුළ සංශෝධනය කිරීමට සැලසුම් කර තිබේ. ඒ අනුව, පහත සඳහන් පනත් සංශෝධනය කිරීම සඳහා සහ එකී පනත් සංශෝධනයන් 2025 වර්ෂයේ රජයේ නීති සම්පාදන වැඩසටහනට ඇතුළත් කිරීම සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත
* 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත
* 2009 අංක 12 දරන ශ්‍රී ලංකා රෙජෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත
* 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත
* 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත හා 2014 අංක 18 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත
* 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනත
* 1996 අංක 4 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන (විශේෂ විධිවිධාන) පනත

06. **1956 අංක 11 දරන රබර් පාලන පනත සංශෝධනය කිරීම**

1956 අංක 11 දරන රබර් පාලන පනත සංශෝධනය කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද, නීතිපති විසින් නිෂ්කාශනය කළ පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා 2024-02-26 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එකී පනත් කෙටුම්පත 2024-05-22 වන දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ තිබේ. එහෙත්, 2024-09-24 දින පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. එබැවින්, 1956 අංක 11 දරන රබර් පාලන පනත සංශෝධනය කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත නැවත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ විෂය පථයට අදාළව නව නීති හඳුන්වා දීම හා පවත්නා පනත් සංශෝධනය කිරීම

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ විෂය පථයට අදාළව රාජ්‍ය ප්‍රතිපත්තීන්ගේ ප්‍රමුඛත්වය අනුව 2025 වර්ෂය තුළ දී දැනට පවතින පනත් සංශෝධනය කිරීමේ සහ අලුතින් පනත් සම්පාදනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගෙන ඇත. ඒ අනුව, පහත සඳහන් නව නීති හඳුන්වා දීම හා පනත් සංශෝධනය කිරීම 2025 වර්ෂයේ රජයේ නීති සම්පාදන වැඩසටහනට ඇතුළත් කිරීම පිණිස වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* 1958 අංක 2 දරන තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) පනත සංශෝධනය කිරීම
* 2005 අංක 19 දරන සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනත සංශෝධනය කිරීම
* 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල පනත සංශෝධනය කිරීම
* 1957 අංක 51 දරන තේ පාලන පනත සංශෝධනය කිරීම
* 1956 අංක 11 දරන රබර් පාලන පනත සංශෝධනය කිරීම
* වැවිලි කළමනාකරණ පනත ලෙස නව පනතක් හඳුන්වා දීම
* තුරුයාවිය සමිතීන්හි බලතල රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරීම සඳහා නව පනතක් හඳුන්වා දීම
* 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතට කාලීන අවශ්‍යතාව මත නව රෙගුලාසි ඇතුළත් කිරීමට හැකි වන ලෙස එම පනතට සංශෝධන ගෙන ඒම
* 1975 අංක 14 දරන තේ මණ්ඩල පනත සහ රෙගුලාසි ආශ්‍රිත සංශෝධන සිදු කිරීම

08. රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් තනතුර සඳහා පත් කිරීම

රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් තනතුරෙහි සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ඩබ්ලිව්. ප්‍රින්ස් සේනාධීර මහතා බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තනතුරට පත් කිරීමත් සමඟ එම තනතුර පුරප්පාඩු වී ඇත. ඒ අනුව, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික

කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන) වශයෙන් දැනට සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි තිලක් නන්දන හෙට්ටිආරච්චි මහතා රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් තනතුරට වහාම ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම පිණිස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) සහ වියට්නාමයේ රාජ්‍යතාන්ත්‍රික විද්‍යායතනය අතර අවබෝධතා ගිවිසුම**

සංකීර්ණ සමකාලීන ලෝකයේ එකිනෙකා සමඟ සමීප ව සම්බන්ධ වී ඇති ද්විපාර්ශ්වික, කලාපීය සහ ජාත්‍යන්තර කටයුතු සඳහා නව්‍ය අදහස් සහ මත ලබා ගැනීමේ අරමුණ සහිතව පොදුවේ උනන්දුවක් දක්වන ක්ෂේත්‍රවල අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් සහයෝගිතාවක් පවත්වා ගැනීම සඳහා ආයතනික සබඳතා ඇති කර ගැනීමට ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය සහ වියට්නාමයේ රාජ්‍යතාන්ත්‍රික විද්‍යායතනය අතර එකඟතාවකට පැමිණ ඇත. ඒ සඳහා අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීමට යෝජිත අතර එමඟින් විශේෂඥතාව බෙදා ගැනීම, රාජ්‍යතාන්ත්‍රිකයින්, විද්වතුන්, නිලධාරීන්, විශේෂඥයින් සහ පර්යේෂකයින් හුවමාරු කර ගැනීම මෙන්ම අධ්‍යයන හා පර්යේෂණ වැඩසටහන්, විවිධ පාඨමාලා, සම්මන්ත්‍රණ, රාජ්‍යතාන්ත්‍රික ක්ෂේත්‍රයේ අනෙකුත් අධ්‍යයන කටයුතු සහ පුහුණුවීම්වලට අදාළ විශේෂඥතාව සංවිධානය කිරීම සහ හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සලසා ගැනීමට අපේක්ෂිත ය. ඒ අනුව, වසර තුනක (03) කාලයක් සඳහා වලංගු වන අවබෝධතා ගිවිසුමකට දෙපාර්ශ්වය අතර අත්සන් තැබීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**10. ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය සහ වියට්නාමයේ කර්මාන්ත හා වෙළෙඳ අමාත්‍යාංශය අතර යන්ත්‍රෝපකරණ නිෂ්පාදන සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම (MoU) අලුත් කිරීම**

දෙරට අතර විදුලි යන්ත්‍රෝපකරණ සහ උපකරණ නිෂ්පාදනය ඇතුළු යාන්ත්‍රික උපකරණ සහ යාන්ත්‍රික උපකරණ අංශයේ ද්විපාර්ශ්වික සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම සඳහා එවකට කර්මාන්ත විෂයභාර අමාත්‍යාංශය සහ වියට්නාම සමාජවාදී ජනරජයේ කර්මාන්ත හා වෙළෙඳ අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමකට 2011 වර්ෂයේදී අත්සන් තබා ඇත. 2019 වර්ෂයේදී දෙරට අතර පැවති වෙළඳාම පිළිබඳ අනුකමිටුවේ දෙවන රැස්වීමේදී එකී අවබෝධතා ගිවිසුම අලුත් කිරීමට දෙපාර්ශ්වයම එකඟතාවකට පැමිණ තිබේ. ඒ අනුව, දියුණු තාක්ෂණයන් හුවමාරු කිරීමට පහසුකම්

සැලසීමෙන් සහ දේශීය පාර්ශ්වකරුවන් සඳහා පුහුණුව සහ ධාරිතා ගොඩනැංවීමේ කටයුතු සඳහා ප්‍රවේශය ලබා දෙමින් සංශෝධන ඇතුළත් කොට යාවත්කාලීන කරන ලද යන්ත්‍රෝපකරණ නිෂ්පාදන සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම දෙපාර්ශ්වය අතර අත්සන් තැබීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **වියට්නාම වෙළෙඳ ප්‍රවර්ධන ආයතනය (VIETRADE) සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම**

ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර වෙළෙඳ සහයෝගිතාව ශක්තිමත් කිරීම සඳහා වියට්නාම වෙළෙඳ ප්‍රවර්ධන ආයතනය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට යෝජනා වී ඇත. දෙපාර්ශ්වයට අදාළ වෙළෙඳාම පිළිබඳ තොරතුරු සහ වෙළෙඳපොළ බුද්ධිය හුවමාරු කර ගැනීම, දෙරටේම පැවැත්වෙන වෙළෙඳ ප්‍රදර්ශන, ප්‍රදර්ශන සහ ප්‍රවර්ධන අවස්ථා සඳහා ඒකාබද්ධ සහභාගිත්වය සහ ව්‍යාපාරික නියෝජිත කණ්ඩායම් අතර රැස්වීම් සංවිධානය කිරීම ඇතුළු පුළුල් පරාසයක වෙළෙඳ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා මෙම අවබෝධතා ගිවිසුම යටතේ අවකාශ සැලසේ. මෙම සහයෝගිතාව මඟින් විශේෂයෙන් සැකසූ ආහාර, ධීවර කටයුතු, ඇඟලුම් සහ අගය එකතු කළ කෘෂිකර්මාන්තයට හැලකිය යුතු වෙළෙඳපොළ අවස්ථාවන් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙටුම්පත් අවබෝධතා ගිවිසුම සඳහා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ එකඟතාව ලැබී ඇත. ඒ අනුව, අදාළ අවබෝධතා ගිවිසුම වියට්නාම වෙළෙඳ ප්‍රවර්ධන ආයතනය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය අතර අත්සන් තැබීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **භූමිය මත ඉදි කර ඇති සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා බලාගාරවලින් මෙගාවොට් 152ක විදුලිය ප්‍රසම්පාදනය කිරීම**

2023-2042 දිගුකාලීන ජනන ව්‍යාපෘති සැලැස්මට අනුව වර්ෂ 2030 වන විට බලශක්ති අවශ්‍යතාවයෙන් 70%ක් පුනර්ජනනීය බලශක්තියෙන් සපුරා ගැනීම රජයේ ප්‍රතිපත්තිය වේ. ඒ අනුව, අපේක්ෂිත විදුලි ඉල්ලුම ක්‍රමයෙන් අඩු වීම සහ පියැසි මත සවි කරන සූර්ය බලශක්ති පද්ධති ධාරිතාව මෑතකාලීනව සීඝ්‍රයෙන් වර්ධනය වීම සැලකිල්ලට ගෙන, ග්‍රිඩ් උපපොළවල් 18ක් සඳහා වෙන් කරනු ලැබිය හැකි මෙගාවොට් 152ක භූමිය මත ඉදි කෙරෙන සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා ධාරිතාවක් හඳුනාගනු ලැබ ඇත. එකී මෙගාවොට් 152ක සමස්ත ජාල ධාරිතාව

ජාත්‍යන්තර තරගකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය සඳහා පමණක් වෙන් කිරීමටත්, ඒ සඳහා ඉදි කිරීම, අයිතිය දැරීම සහ ක්‍රියාත්මක කිරීම යන පදනම යටතේ ව්‍යාපෘති සංවර්ධකයින්ගෙන් විදුලිය ප්‍රසම්පාදනය කිරීම පිණිස යෝජනා සඳහා ඉල්ලීම් නිකුත් කිරීම මගින් ලංසු කැඳවීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමටත් බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සහයෝගිතාව සඳහා ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ වියට්නාමයේ කෘෂිකර්ම විද්‍යා ඇකඩමිය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම

කෘෂිකාර්මික සහයෝගිතාව අරමුණු කර ගනිමින් 2006 වර්ෂයේදී ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තබා ඇත. ඒ අනුව, දෙපාර්ශවයේ එකඟතාව මත 2010-2011, 2017-2019, 2022-2024 හා 2024-2026 වර්ෂයන් සඳහා ක්‍රියාකාරී සැලසුම් අත්සන් කර ක්‍රියාත්මක කර තිබේ. 2024-2026 ක්‍රියාකාරී සැලස්මේ එක් අංගයක් ලෙස දෙරටේ ආයතන අතර සහයෝගිතාව වර්ධනය කර ගැනීම සඳහා කටයුතු කිරීමේ හැකියාව පවතී. ඒ අනුව, මෙරට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා වියට්නාමයේ කෘෂිකර්ම විද්‍යා ඇකඩමිය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට යෝජනා වී තිබේ. යෝජිත කෙටුම්පත් අවබෝධතා ගිවිසුම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව ලැබී තිබේ. ඒ අනුව, එකී අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. රාජ්‍ය වාණිජ ව්‍යාපාර කළමනාකරණ පනත් කෙටුම්පත

මහා භාණ්ඩාගාරයට සහ රටේ ආර්ථිකයට අඛණ්ඩව වැය බරක් නොවී දේශීය හෝ විදේශීය ආයෝජනවල සහාය ඇතිව රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කර මනා පාලනයකින් යුතුව පවත්වා ගත යුතු බව හඳුනා ගෙන ඇත. ඒ සඳහා කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතු බව නව රජයේ ප්‍රතිපත්තිය වේ. රජය සතු ව්‍යාපාරික සමාගම් මනා කළමනාකරණයකින් යුතුව හා අවශ්‍ය ප්‍රතිසංස්කරණයන් සිදු කර පවත්වාගෙන යාමට අවශ්‍ය නව නෛතික රාමුවක් හඳුන්වා දීම සඳහා "රාජ්‍ය වාණිජ ව්‍යාපාර කළමනාකරණ පනත් කෙටුම්පත" නමින් මූලික කෙටුම්පතක් මේ වන විට සකස් කර ඇත. එමගින්, රාජ්‍ය ව්‍යවසායයන් සම්පූර්ණයෙන්ම දේශපාලන බලපෑම්වලින් ඉවත් කිරීමටත්, එහි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෘත්තීය සුදුසුකම් සහිත ක්ෂේත්‍රයන්හි ප්‍රවීණත්වයක් සහිත වෘත්තිකයන් පත් කිරීමටත් හැකි වනු ඇත. ඒ අනුව, එකී මූලික කෙටුම්පත සඳහා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීමටත්, එකී මූලික කෙටුම්පත

සමාලෝචනය කර තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම පිණිස පහත සඳහන් සංයුතියෙන් යුත් විශේෂ කමිටුවක් පත් කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ප්‍රනාන්දු මැතිතුමා,
  කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය - (සභාපති)

* ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා
  කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය

* ගරු වසන්ත සමරසිංහ මැතිතුමා
  වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍ය

* ගරු ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමා
  මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය

***********